මාතලේ මහා නගර සභාව
මාතලේ දිස්ත්‍රික්කය
-----------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට මාතලේ මහ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
---------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අත්තිකාරම් රු.108,181 ක් වැඩියෙන් දක්වා තිබුණි. | අත්තිකාරම් ගිණුමේ දක්වන ලද රු.108,181 ක මුදල පරීක්ෂා කර නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | පෞද්ගලික ආයතනයෙන් අය විය යුතු රු.323,755 ක මුදල ශේෂ පිරික්සුමේ ලැබිය යුතු ලෙස දක්වා ඇත. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාළ රු.232,000 ක ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම් ගිණුම්වල දක්වා නොතිබුණි. | මුද්දර ගාස්තු ගිණුම්වල ගැළපීමට කටයුතු කළ යුතු වේ. | 2018 අප්‍රේල් මාසයට අදාළ මුද්දර ගාස්තු රු.232,000 සඳහා අදාළ උපලේඛන පරීක්ෂා කර ඇතත් චෙක්පත් මේ වන තෙක් මෙම සභාවට ලැබී නොමැත. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයට අදාළ ගෙවියයුතු විශ්‍රාම වැටුප් දායක මුදල රු.570,167 ක් ගිණුම්වල වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | සොයාබලා කටයුතු කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | දිගු කලක සිට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු.15,155,076 ක ශේෂය රු.14,618,675 ක් ලෙස දැක්වීමෙන් රු.536,401 කින් ණය හිමියන් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි වටිනාකම පරීක්ෂා කර නිවැරදි කළ යුතු වේ. | ජ'නල් සටහන් බලා කටයුතු කරනු ලැබේ. |
| (ඉ) | ධාවන තත්ත්වයේ ඇති රු.5,300,000 ක් වටිනා වාහන 3 ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | පොතේ සඳහන් ආකාරයට වත්කම් ලේඛන ගළපා බලා මෙහි පෙන්වා ඇති කුමන හෝ වාහනයක් ඇතුළත් වී නොතිබුණේ නම් එය ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ඊ) | මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු රු.2,307,001 ක් වටිනා වාහන 13 ක් භෞතිකව නොපැවතුණි. | භෞතිකව නොමැති වත්කම් සොයාබලා ගිණුම්වලට ගැළපීම හා නිසි ක්‍රියාමාර්ග ගත යුතු වේ. | පොත්වල සඳහන් මූර්ත වටිනාකම්වලට අනුව ගිණුම් පෙන්වා ඇත. |
| (උ) | කොටුවේගෙදර උතුරු නගර මායිමේ පොඩි පාලම අසළ මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තයේ ගිවිසුම්ගත රු.263,000 ක මුදල රු.26,300 ක් ලෙස කර්මාන්ත ණය හිමියන් යටතේ ගිණුම්ගත කර තිබුණි. | සිදුවී ඇති ගිණුම්කරණ දෝෂය ජ'නල් සටහන් මඟින් ගැළපීමට කටයුතු කළ යුතු වේ. | ගිණුම්ගත මුදල රු.263,000 ක් වුවද අතපසුවීමකින් රු.26,300 ක් ලෙස සටහන් වී ඇත. ජ'නල් සටහන් මඟින් නිවැරදි කරමි. |

1.3.2 නොසැසඳුනු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.162,848,650 ක් වූ ගිණුම් විෂයයන් 9 කට අදාළ ශේෂ සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන එකතුව රු.180,646,992 ක් වූ ශේෂ අතර රු.22,981,812 ක නොසැසඳීම් විය. | ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | උපයෝගී ලේඛනයේ ශේෂය අඩුවීමට හේතුව පවතින ශුද්ධ ශේෂය අතර ලැබීම් ගෙවීම් හා මාසික වාරික ලැබීම් ගලපා අවසාන ගිණුමේ ශේෂය සඳහා නොමැති වීමෙනි. සොයාබලා කටයුතු කරමි. |

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|

(අ) ලැබිය යුතු ගිණුම්

| | | |
|---|---|---|
| වර්ෂ 3 කට වැඩි කාලයක් ඉක්මවූ ලැබිය යුතු ගිණුම් ශේෂ 8 හි එකතුව රු.4,876,065 ක් විය. | මහා නගර සභා ආඥා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම හා ලැබියයුතු ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කරනු ලබන අතර ගෙවීම් මගහැරී ඇති නිසා මෙවන් තත්ත්වයක් උද්ගත වී ඇත. |

(ආ) ගෙවිය යුතු ගිණුම්

| | | |
|---|---|---|
| වර්ෂ තුනක කාලයක් ඉක්මවූ ණයහිමි ශේෂයන්ගේ එකතුව රු.72,953,228 ක් විය. | ණයහිමි ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී මෙම ණයහිමි ශේෂ නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු කරමි. |

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

තොරතුරු ඉදිරිපත් නොකිරීම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.13,690,623 ක් වූ ගිණුම් විෂයයන් 7 කට අදාළව සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | දිගින් දිගටම ඉදිරියට එන ශේෂයන් හා අනෙකුත් ශේෂයන් සොයාබලා සාක්ෂි රැස් කරගෙන ඉදිරිපත් කළ යුතු වේ. | පෙර කාලවල උද්ගත වූ දිගින් දිගටම පැවත එන ශේෂයන් 2018 දෙසැම්බර් මස නිරවුල් කිරීමට නොහැකි වූ අතර ඒවා එක් එක් ශේෂයන් වෙන වෙනම කරුණු විමසා බලා නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු කිරීමට උපදෙස් ලබාදෙන ලදී. |

1.4 අනුකූල නොවීම

-------------------

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

------------------------------------------------------------------------

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1893 අංක 9 දරන ගෝඝාතකාගාර ආඥා පනත - 5, 6 හා 7 වගන්ති | සභාබල ප්‍රදේශය තුළ වසර 10 කට වැඩි කාලයක් තිස්සේ පවත්වාගෙන යනු ලබන පෞද්ගලික ගෝඝාතකාගාර 3 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. එසේම පරිසර ආරක්ෂණ බලපත්‍ර ද ලබාගෙන නොතිබුණි. | පනතේ විධිවිධානයන් අනුව කටයුතු කළ යුතු වේ. | නගර සභාව සතු ගෝඝාතකාගාරයක් නොමැති බැවින් බල ප්‍රදේශයේ හා බල ප්‍රදේශයෙන් පිටත මස් අවශ්‍යතා සපුරාලීමට නගර සභාවට වෙනත් කිසිදු ක්‍රමවේදයක් නොතිබූ නිසා ගව ගෝඝාතකාගාර බලපත්‍ර නිකුත් කර ඇත. |
| (ආ) | 1989 ජනවාරි 20 දිනැති අංක 541/17 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් පළ කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාවේ III කොටස - 15 වගන්තිය | තක්සේරුගත වටිනාකම රු.1,020,272,000 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි 38ක් සහ වටිනාකම සඳහන් නොවූ ඉඩමක් ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් කර නොතිබුණි. | සමීක්ෂණය කර තක්සේරු කරන ලද ඉඩම් හා ගොඩනැගිලි ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් කළ යුතු වේ. | දැනට ස්ථිර වත්කම් සමීක්ෂණ මණ්ඩලයක් පත්කර සභාව සතු ඉඩම්, ගොඩනැගිලි හඳුනාගෙන ඇත. තාවකාලික තක්සේරුවක් කර අවසන් ගිණුමටද ඇතුළත් කර ඇත. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 104 හා 105 | 2017 හා 2018 වර්ෂවල සිදු වූ වාහන අනතුරු 3 ක් සම්බන්ධයෙන් පරීක්ෂණ අවසන් කර නොතිබුණි. | අදාළ පරීක්ෂණ අවසන් කර නිසි ක්‍රියාමාර්ග ගැනීම කළ යුතු වේ. | KH - 4277 දරන රථයේ පරීක්ෂණ වාර්තාව මේ වන තෙක් ලැබී නොමැති අතර අනෙකුත් අනතුරු පිළිබඳව මූලික පරීක්ෂණ අභ්‍යන්තර විගණන අංශ විසින් අවසන් කර ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.99,916,360 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.63,175,930 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුග ත ආදායම | බිල් කළ ආදායම | 2016 රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 36,772,000 | 36,735,292 | 25,247,284 | 24,248,572 | 36,150,000 | 36,221,114 | 24,756,470 | 23,836,699 |
| (ii) | කුලී | 18,855,000 | 18,023,309 | 15,537,642 | 3,803,085 | 18,671,000 | 19,110,584 | 16,528,021 | 4,167,134 |
| (iii) | බලපත්‍ර | 8,553,000 | 11,216,012 | 10,993,012 | 223,000 | 8,033,000 | 10,647,215 | 10,089,290 | 14,000 |
| (iv) | වෙනත් ආදායම් | 60,583,000 | 73,434,939 | 48,917,591 | 31,711,788 | 45,483,600 | 60,732,943 | 15,311,825 | 52,993,783 |
| | එකතුව | 124,763,000 | 139,409,552 | 100,695,529 | 59,986,445 | 108,337,600 | 126,711,856 | 66,685,606 | 81,011,616 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සුපිරි වෙළඳ සංකීර්ණයේ කඩකාමර බදුකරුවන් 14 දෙනෙකුගෙන් 2014 වර්ෂය අවසාන වන විට අය විය යුතු එක්වන් මුදල් හා ඊට අදාළ 10% ප්‍රමාද ගාස්තු ඇතුළුව රු.23,425,994 ක් අයකර ගෙන නොතිබුණි. | ලැබිය යුතු මුදල් හා ප්‍රමාද ගාස්තු අය කර ගත යුතු වේ. | සභා තීන්දුව බලා කටයුතු කරනු ඇත. |
| (ආ) | මහ නගර සභාව විසින් පවත්වාගෙන යන ලද ජල සැපයුම් පද්ධතිය 2001 වර්ෂයේදී ජාතික ජල සම්පත් මණ්ඩලයට පවරන අවස්ථාව වන විට | අදාළ ශේෂයන් අයකර ගත යුතු වේ. | පොත්වල මෙම අය වීමට ශේෂයන් ඇති අතර ඒ පිළිබඳව කිහිපවතාවක් ලිපි හුවමාරු කර අදාළ කටයුතු නිරවුල් කර |

| | | | |
|---|---|---|---|
| | අය වීමට තිබුණු රු.4,802,812 ක හිඟහිටි ජල ගාස්තු අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | | ගැනීමට කටයුතු කළත් ජල සම්පත් මණ්ඩලයේ හිඟ මුදල් මෙතෙක් ලැබී නොමැති බැවින් ඉදිරියේදී මෙම හිඟ මුදල් නිරවුල් කරමි. |

2.2.3 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 ජනවාරි 01 දිනට හිඟය රු.23,836,699 කින් අයකර තිබුණේ රු.10,969,758 ක් පමණි. | මහ නගර සභා ආඥා පනතේ විධිවිධානයන් අනුව කටයුතු කර ආදායම් අය කර ගත යුතු වේ. | වරිපනම් අය කිරීම බිල් කරනු ලබන්නේ කාර්තු වශයෙන් වන අතර නිරන්තර හිඟ ශේෂයක් පවතී. අදාළ කොට්ඨාශභාර ආදායම් පරීක්ෂක නිලධාරින් විසින් දේපළ තහනමට ගැනීමේ නිවේදන ලබාදී ඇත. දේපළ තහනමට ගැනීමට කටයුතු කර ඇත. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.15,000 ක් ඉක්මවූ වරිපනම් ඒකක 129 කින් රු.3,739,860 ක් අය විය යුතුව තිබූ අතර, ඔවුන්ගේ හිඟ කාල පරාසය කාර්තු 4 සිට 59 දක්වා විය. | මහා නගර සභා ආඥා පනතේ විධිවිධානයන් අනුව කටයුතු කර ආදායම් අය කර ගත යුතු වේ. | හිඟ වරිපනම් බදු ගෙවන්නන් දිරිමත් කර හිඟය අය කර ගැනීමට කටයුතු කර ඇත. එසේම ආදායම් පරීක්ෂක නිලධාරින් දෙදෙනෙකුගේ (02) පුරප්පාඩු මත එම කොට්ඨාශද ආවරණය කරමින් රාජකාරි ඉටුකරගෙන යනු ඇත. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කාර්තු 4 කට වඩා හිඟව පැවැති රාජ්‍ය ආයතන 26 කින් අයකර ගත යුතු වරිපනම් රු.2,228,256 ක් විය. | පළාත් පාලන කොමසාරිගේ 2015/08 චක්‍රලේඛය අනුව කටයුතු කර වරිපනම් අය කර ගත යුතු වේ. | විශාල හිඟ මුදලක් පැවති ආයතන සඳහා කාල විශ්ලේෂණ වාර්තා 2019 වර්ෂයේ මුල් මාස කිහිපය තුළ සකස් කර යවා ඇති අතර ඒවා සහ අනෙකුත් ගෙවීම් නොකළ ආයතන සඳහා 2015/8 චක්‍රලේඛය පරිදි ඉදිරි කටයුතු කිරීම ආරම්භ කර ඇත. |

2.2.4 කුලී

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | වසර 3 ට වඩා වැඩි කාලයක සිට පැවත එන රු.453,596 ක හිඟහිටි කුලී සම්බන්ධයෙන් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර කුලී අය කිරීම හා නිසි ක්‍රියාමාර්ගයන් අනුගමනය කළ යුතු වේ. | කුලී නොගෙවන ස්ථාන හඳුනාගෙන ඒවායේ පවතින ගැටලු නිරාකරණය කර ඒවා ටෙන්ඩර් කිරීමට හෝ දෛනික කුලී පදනමට ලබාදීම සහා තීන්දුව පරිදි කටයුතු කරගෙන යාමට ඉදිරියේ අවශ්‍ය කටයුතු කරමි. |
| (ආ) | 2007 වර්ෂයේ සිට පුද්ගලයින් 04 දෙනෙකුගෙන් අය විය යුතු රු.307,281 ක වැසිකිළි බදු කුලී අය කරගෙන නොතිබුණි. | කුලී නිසි පරිදි අය කර ගැනීමට හා නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු වේ. | වැසිකිළි බදු කුලී ශේෂයන් අය කිරීමට කටයුතු කර ඇති අතර නොගෙවන ඒවා පිළිබඳ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. |
| (ඇ) | 2018 වර්ෂයට අදාළ මාසික තානායම් කුලී හා එකතු කළ අගය මත බදු මුදල් ඇතුළත්ව රු.1,534,752 ක මුදලක් හිඟ හිටව තිබුණි. | කුලී නිසි පරිදි අය කර ගැනීමට හා නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු වේ. | සභාව සතුව තිබූ තානායම නාගරික සංවර්ධන අධිකාරිය පවරාගෙන ඇති අතර සභාවට ලැබිය යුතු තානායම් කුලිය දිගින් දිගටම හිඟව ඇත. |
| (ඇ) | කොකාකෝලා කුටි හා ලොතරැයි කුටිවලින් රු.76,542 ක් වූ කුලී මුදල් අයකරගෙන නොතිබුණි. | නීතිමය කටයුතුවල පසු විපරම් ක්‍රියාවලිය සිදු කළ යුතු වේ. | නීතිමය කටයුතු සිදුකර ඇත. |

2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ මුදල් රු.384,500 ක් හා මුද්දර ගාස්තු රු.27,225,700 ක් අයවිය යුතුව තිබුණි. | හිඟ ශේෂයන් අය කර ගත යුතු වේ. | උසාවි දඩ හා මුද්දර ගාස්තු ගෙවනු ලබන්නේ පළාත් සභාවෙන් බැවින් එම ගාස්තු නිරන්තරයෙන් මාස ගණනාවක හිඟයක් පවතී. එය නිරවුල් කර ගැනීමට අප විසින් නිරන්තරයෙන් කටයුතු කරමි. |

2.2.6 අධිභාර

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මහ නගර සභා ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිවයුතු අයවලුන්ට එරෙහිව පනවන ලද අධිභාර අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.77,770 ක මුදලක් අය කර ගැනීමට තිබුණි. | අය කිරීමට කටයුතු කිරීම හා අධිභාර නොගෙවන්නේ නම් නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුවේ. | විදේශ චාරිකාවක් සම්බන්ධයෙන් වූ අධිභාරය සම්බන්ධව සොයාබලා ඉදිරියේ කටයුතු කරමි. මේ දක්වා අයවී නොමැති බැවින්, කැන්දගොල්ල අතුරු මාර්ගයට අදාළ අධිභාරයට සම්බන්ධ නිලධාරීන් තිදෙනෙකු විසින් අභියාචනා ඉදිරිපත් කර ඇත. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අපේක්ෂිත නිමවුම් මට්ටම (out put) ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභා අරමුදල් හා විවිධ ප්‍රතිපාදන යටතේ රු.4,179,176 ක් වැය කර වර්ෂ 3 ක කාලයක සිට ඉදිකරමින් පවතින සායන මධ්‍යස්ථාන දෙකක් වැඩ අවසන් කර නොතිබුණි. | ඉදිකිරීම් කඩිනමින් අවසන් කර භාවිතයට ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුරු ලබා දී නොමැත. |

(ආ) අත්හැර දැමූ කර්තව්‍යයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ සභා අරමුදල් යටතේ රු.691,611 ක ප්‍රතිපාදන සලසා තිබූ කර්මාන්ත 3 ක් ඉටු කිරීම අතරමඟ නවතා තිබුණි. | ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කළ යුතු වේ. | පිළිතුරු ලබාදී නොමැත. |

(ඈ) සන අපද්‍රව්‍ය කළමනාකරණය

-----------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | මාසිකව එකතුවන දිරන කසළ මෙට්‍රික් ටොන් 20 ක් වාරියපොල වත්ත නම් පෞද්ගලික ඉඩමකට අවිධිමත් ලෙස බැහැර කරමින් තිබුණි. | ලබා දී ඇති පිළිතුරුවලට අනුව කටයුතු කිරීම හා නිසි අධීක්ෂණයක් සිදු කළ යුතු වේ. | ගං ඉවුරේ සිට අඩි 150 ක් පමණ දුරකින් කසළ බැහැර කරන අතර මේ වනවිට සියලුම කසළ දමා තුනී කරගෙන යමින් පවතී. අපද්‍රවය නිකුත් වන අපජලය ගඟට එකතුවීම වැළැක්වීම සඳහා ඒ අසළ වළක් කපා එයට ගලා යාමට සලස්වා ඇති බවද දන්වමි. |
| (iii) | විහාරගමවත්ත ප්‍රදේශයේ අක්කර 5 ක ඉඩමක් 2010 වර්ෂයේ රුපියල් 2,000,000 කට මිලදී ගෙන එහි සනීපාරක්ෂක කසළ බිම් පිරවුම් මූලික ශක්‍යතා හා සැලසුම් සකස් කිරීම සඳහා රුපියල් 400,000 ක් වැය කර ඇතත් කසළ බැහැර කිරීමට එකී ඉඩම භාවිතා කර නොතිබුණි. | අවශ්‍යතා නිසි පරිදි ඉටුකර ගත යුතුවේ. | සොයාබලා ඉදිරියේදී පිළිතුර ලබාදෙන බව සඳහන් කරමි. |

(ඈ) පාරිසරික ගැටලු

-------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2000 අංක 53 හා 1988 අංක 56 දරන පනත්වලින් සංශෝධිත වූ 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ විධිවිධාන ප්‍රකාරව සභාවේ මල අපද්‍රව්‍ය පිරිපහදු කිරීමේ පද්ධතිය සඳහා පරිසර බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි. | පරිසර බලපත්‍රය කඩිනමින් ලබා ගත යුතුවේ. | පාරිසරික බලපත්‍රය ලබාගැනීම සඳහා අවශ්‍ය අයදුම්පත්‍රය හා ලියවිලි මධ්‍යම පරිසර අධිකාරිය වෙත යොමුකර ඇත. |

(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව විධිමත් පරිදි දැනුවත්ව නොතිබීම හේතුවෙන් දිගු කාලීන සැලසුම් සකස් කර නොතිබුණි. | දිගුකාලීන සැලසුම් සකස් කළ යුතු වේ. | පිළිතුරු ලබා දී නොමැත. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සුපිරි වෙළඳ සංකීර්ණය තුළ පවත්වාගෙන යන මාළු කඩ 5 ක සහ ගොංහාවෙල වෙළඳ සංකීර්ණයේ ඇති මාළු කඩයක් සඳහා 2004 වර්ෂයේ ගිවිසුම්ගතවී තිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත්, කඩ කුලී සංශෝධනය කර නව ගිවිසුම් සඳහා එළඹ නොතිබුණි. | කඩකුලී සංශෝධනය කර ගිවිසුම්වලට එළඹීම කළ යුතු වේ. | පිළිතුරු ලබා දී නොමැත. |
| (ආ) | 2008 වර්ෂයේ සිට වසා තිබෙන ලංකා ධීවර සංස්ථාවට බදු දී තිබූ සුපිරි වෙළඳ සංකීර්ණයේ අංක 33 කඩ කාමරය වෙනුවෙන් අයවීමට තිබූ රු.55,318 ක මුදල අයකර නොතිබුණි. | අය වීමට ඇති මුදල අය කර ගත යුතු වේ. | පිළිතුරු ලබා දී නොමැත. |
| (ඇ) | සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන ගොස් තිබූ ව්‍යාපාර 53 කින් වෙළඳ බලපත්‍ර ගාස්තු, ව්‍යාපාර 80 කින් කර්මාන්ත බදු හා ව්‍යාපාර 15 කින් ව්‍යාපාර බදු අය කරගෙන නොතිබුණි. | වෙළඳ බලපත්‍ර ගාස්තු, කර්මාන්ත බදු හා ව්‍යාපාර බදු අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුරු ලබා දී නොමැත. |
| (ඈ) | සභා බලප්‍රදේශය තුළ පවත්වාගෙන යන මාළු කඩ 9 ක් සඳහා සෞඛ්‍ය නිර්දේශය නොතිබීම හේතුවෙන් වෙළඳ බලපත්‍ර නොමැතිව පවත්වාගෙන යමින් පැවතුණි. | අවශ්‍ය මූලික කටයුතු ඉටුකර ගත යුතු වේ. | පිළිතුරු ලබා දී නොමැත. |

3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ 2018 ජූලි 25 දිනැති අංක CPC/CS/2/3/C/4/02 දරන ලිපිය ප්‍රකාරව මාස 3 ක කාලයකට පමණක් කොන්ත්‍රාත් පදනමින් රියදුරෙකු බඳවා ගැනීමට අනුමතකර තිබූ නමුත් 2018 ජූනි 08 දින සිට එකී රියදුරු සේවයේ යොදවා ගනිමින් වැටුප් ගෙවමින් පැවැතුණි. | 2018 ජූලි 25 දිනැති අංක CPC/CS/2/3/C/4/02 දරන ප්‍රධාන ලේකම්ගේ ලිපිය අනුව කටයුතු කළ යුතු වේ. | මේ පිළිබඳව පළාත් පාලන කොමසාරිස් දැනුවත් කර ඇත. |

3.4 වත්කම් කළමනාකරණය

3.4.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අක්කර 5 යි රූඩ් 2 යි පර්චස් 16 ක් වූ Suduganga Estate නමැති ඉඩම මායිම් යොදා ආරක්ෂා කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩමේ මායිම් හඳුනාගෙන ආරක්ෂාව තහවුරු කළ යුතු වේ. | සුදුගඟ වත්ත නැමැති ඉඩමේ මිනින්දෝරු සැලැස්ම හා තැගි ඔප්පුව නගර සභාව සතුවන අතර ඉඩමේ භෞතිකව මායිම් ලකුණු කර නොමැති බැවින් බලයලත් මිනින්දෝරු මහතුන්ගෙන් මිල ගණන් කැඳවා භෞතිකව මායිම් ලකුණු කිරීම සඳහා කටයුතු කරමින් පවතී. |
| (ආ) | නගර සභාව විසින් විවිධ කටයුතු සඳහා පරිහරණය කරනු ලබන තවත් ඉඩම් 19 ක් සඳහා මිනුම්දෝරු සැලසුම් සකස්කර තිබූ නමුත් එම ඉඩම් සඳහා හිමිකම් ඔප්පු හෝ පැවරුම් නියෝග නොතිබුණි. | ඉඩම්වලට අදාළ ඔප්පු පැවරුම් නියෝග ලබාගෙන ඉදිරිපත් කළ යුතු වේ. | ඔප්පු නොමැති ඉඩම් සඳහා රෙජිස්ට්‍රාර් වෙතින් ඉල්ලීමක් කර ඇති අතර මෙසේ නොහැකි වන ඉඩම් සඳහා ප්‍රකාශන ඔප්පු සකස් කිරීම සඳහා කටයුතු කරමින් පවතී. |
| (ඇ) | ඉඩම් හා ගොඩනැගිලි සමීක්ෂණ වාර්තාව අනුව සභාවට අයත් රුපියල් 2,600,000 ක් වටිනා ඉඩම් 2 ක අනවසරයෙන් ගොඩනැගිලි සාදා පදිංචි වී ඇති මුත්, ඒ | මේ සම්බන්ධව ගෙන ඇති ක්‍රියාමාර්ග පැහැදිලි කළ යුතු වේ. | වත්කම් සමීක්ෂණ මණ්ඩලය මගින් මෙම ස්ථාන 02 හඳුනාගෙන ඇති අතර මෙම ඉඩම් දෙකේ සන්තකය නගර සභාවට භාර ගැනීම සඳහා කටයුතු කරමින් පවතින බව |

| | | |
|---|---|---|
| සම්බන්ධයෙන් කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි. | | දන්වමි. |

3.4.2 නිෂ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 මාර්තු 21 දිනැති ඉඩම් හා ගොඩනැගිලි සමීක්ෂණය වාර්තාව අනුව සභාවට අයත් රු.800,000 ක් වටිනා අලුවිහාරය ළමා උද්‍යානය ඉඩම ප්‍රයෝජනවත් කාර්යයකට යොදා ගෙන නොතිබුණි. | අපේක්ෂිත අරමුණුවලට අනුව ඵලදායීව යොදා ගත යුතු වේ. | අලුවිහාර ළමා උද්‍යානය ඉඩම ඉදිරියේදී ළමා උද්‍යානයක් ලෙස සංවර්ධනය කිරීමට කටයුතු කරමින් පවතින බව දන්වමි. |

3.5 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවස්ථා දෙකකදී මිල ගණන් කැඳවීම සඳහා දැන්වීම් පලකිරීමට රු.218,121 ක් වැය කර පසුව එම මිලදී ගැනීම් ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් ඒ සඳහා වැයකළ මුදල් නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. | මිලදී ගැනීම් විධිමත් ආකාරයෙන් සිදු කළ යුතු වේ. | තාක්ෂණ ඇගයීම් කමිටුවේ වාර්තා අනුව එවා ඇති මිල ගණන් මිලදී ගැනීම සඳහා යෝග්‍ය නොවන බවට නිර්දේශ කර ඇති බැවින් අදාළ මිලදී ගැනීම් සිදුකර නොමැත. |

3.6 ප්‍රසම්පාදනය

3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 හා 4.2.3 අනුව ප්‍රසම්පාදන සැලැස්මක් හා ප්‍රසම්පාදන කාල සටහනක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කළ යුතු වේ. | පිළිතුරු ලබා දී නොමැත. |

3.6.2 සැපයීම් හා සේවා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සම්මත අතුරු ව්‍යවස්ථාවේ v කොටසේ 11(ඇ) ප්‍රකාරව අවම මිලට වඩා වැඩි මිලකට මිලදීගෙන තිබූ එකතුව රු.149,145 ක් වූ මිලදී ගැනීම් සඳහා අවස්ථා 02 ක් සඳහා මුදල් කාරක සභා නිර්දේශය ලබාදී නොතිබුණි. | පවතින නීති, රීති හා රෙගුලාසි අනුගමනය කළ යුතු වේ. | නගර සභාවේ විවිධ සංවර්ධන කාර්යයන් කිරීමේදී ඇති වන්නා වූ තත්ත්වයක් සලකා කළයුතු හොඳම හා අරපිරිමැසුම්දායක කටයුත්ත වෙනුවෙන් වියදම දරා ඇත. |
| (ආ) | LED වීථි පහන් මිලදී ගැනීමේදී අංක 541/17 දරන ගැසට් පත්‍රයේ පළවූ මහා නගර සභා සම්මත අතුරු ව්‍යවස්ථාවේ V කොටසේ 3(4)(ඈ) හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3:2 හෝ 3:4 වගන්තිවලට පටහැනිව අවිධිමත්ව තෝරාගත් ආයතන වෙතින් අවස්ථා 3 කදී මිල ගණන් කැඳවා තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශවලින් තොරව හා වගකීම් විරහිතව රු.715,000 ක් වටිනා LED වීථි පහන් මිලදීගෙන තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කළ යුතු වේ. | ගරු නගරාධිපතිතුමාගේ ඉල්ලීම පරිදි 150w සඳහා එක්වරකදී හා 100w සඳහා තවත් වතාවකදී මිල කැඳවීම සිදුකරන ලදී. බල්බ 60 ක් මිලදී ගැනීම සඳහා පුවත්පත් දැන්වීමක් පළ කළේ නම් ඒ සඳහා වැඩි මුදලක් වැයවන බැවින් මෙම මිලදී ගැනීමට ලියාපදිංචි තැපෑලෙන් ලිපි යොමුකර මිල ගණන් ලබා ගන්නා ලදී. |
| (ඇ) | ඉදිරි ඉදිරිපත් කර තිබූ මිල ගණන් අතරින් 100w LED බල්බ හා 150w LED බල්බ සඳහා අවම මිල වූ රු.6,900 ක් හා රු.6,500 පිළිබඳව තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශයකින් තොරව පිළිවෙළින් රු.11,500 ක් හා රු.12,750 ක මුදලකට මිල ගණන් ඉදිරිපත් කර තිබූ සැපයුම්කරුගෙන් මිලදී ගැනීම හේතුවෙන් සභා අරමුදලට රු.309,000 ක පාඩුවක් සිදුව තිබුණි. | ටෙන්ඩර් මණ්ඩල හා තාක්ෂණික ඇගයීම් වාර්තා අනුව කටයුතු කළ යුතු වේ. | අවම මිල ඉදිරිපත් කර තිබූ ලාම්පුව අවශ්‍යතාවයට නොගැළපෙන බව ටෙන්ඩර් කමිටුව විසින් තීරණය කළ අතර සභා විධානය පරිදි කටයුතු කර ඇති බව කාරුණිකව දන්වන අතර මිලදී ගන්නා ලද ලාම්පු මඟින් සභාවට පාඩුවක් සිදුව නොමැත. |

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ අවස්ථාව 02 කදී පමණක් විගණන හා කළමනාකරණ කමිටු පවත්වා තිබුණි. | කාර්තුවකට 1 බැගින් විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතු වේ. | 2019 වර්ෂයේ සිට නියමිත පරිදි විගණන කමිටු පැවැත්වීමට කටයුතු යොදා ඇත. |

4.2 පිළිතුරු නොදුන් විගණන විමසුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දින වන විට සභාවට ඉදිරිපත් කර තිබූ ගණනය කළ හැකි වටිනාකම රු.12,531,771 ක් වූ විගණන විමසුම් 5 කට පිළිතුරු සපයා නොතිබුණි. | ජාතික විගණන පනතේ 38(1)(ඉ) පරිදි කටයුතු කිරීම. | 2018 දෙසැම්බර 31 වන දින වන විට සභාව වෙත ඉදිරිපත් කර තිබූ විගණන විමසුම්වලින් එනම් 2019.05.31 වන විට විගණන විමසුම් 5 ට පමණක් පිළිතුරු යැවීමට ඇති බැවින් හා මේ වනවිට ඒ සඳහා පිළිතුරු සකස් කරමින් පවතින බව කාරුණිකව සඳහන් කරමි. |